**අම්පාර FPA සුව සේවා මධ්‍යස්ථානය**

අම්පාර දිස්ත්‍රික්කය තුළ FPA සුව සේවා මධ්‍යස්ථානය සංවිධානය කළ වැඩසටහන් සහ ජංගම වෛද්‍ය සායන ගණනාවකි.

## අම්පාර කොටවෙහෙර ජංගම වෛද්‍ය සායනය



අම්පාර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නියෝජ්‍ය අමාත්‍ය අනෝමා ගමගේ මහත්මිය සහභාගී වූ අවස්ථාව, සහකාර අධ්‍යක්ෂ සුනිල් සේනාරත්න මහතා අම්පාර සුවසේවා මධ්‍යස්ථානයේ වැඩසටහන් සම්බන්ධීකාරක ජයසිරි කුලරත්න මහතා ඇතුළු පිරිස ඡායාරූපයේ වේ.



බාලදක්ෂකාවියන් සඳහා පැවැති වැඩසටහන සහකාර අධ්‍යක්ෂ සුනිල් සේනාරත්න මහතා විසින් මෙහෙයවමින්

## ලිලී ව්‍යාපෘතිය

ලිලී ව්‍යාපෘතිය යටතේ කඩුවෙල හොරහේන සණස සාමාජික සාමාජිකාවන් සඳහා වෛද්‍ය සායනයක් සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවති අවස්ථාව. කඩුවෙල සහ මහරගම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල මේ සඳහා සහභාගී විය.



කළමනාකාරිණී සුනීතා රත්නායක මහත්මිය විසින් දැනුවත් කිරීමේ වැඩසටහනක් මෙහෙයවමින්

## විවිධ අවශ්‍යතා ඇති පිරිස් සඳහා වැඩසටහන්

විවිධ අවශ්‍යතා ඇති පිරිස් සඳහා ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් පසුගියදා සංවිධානය කර තිබුණි. අනුරාධපුර මහඉලුප්පල්ලම දෘශ්‍යාබාධිත විශේෂ තාක්ෂණික විද්‍යාලයේදී සහ නුවර පරිවාස හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේදී මෙම වැඩසටහන් පැවැත්වුනි.



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ Happy Life මධ්‍යස්ථානයේ කලමණාකාරිනි මල්ලිකා සමරවික්‍රම මහත්මිය විසින් දේශනයක් සිදුකරමින්

## කාර්ය මණ්ඩල සුහද හමුව...








# FPA පුවත් සංග්‍රහය

2015 තුන්වන කලාපය

www.fpasrilanka.org

තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...



**ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට**
**අමතන්න 2 588 488**
**පිවිසෙන්න www.happylife.lk**
**SMS කරන්න 071 6 408 408**

37/27, බුලර්ස් පටුමග, කොළඹ 07. දුරකථන : 011 2 555 455
ෆැක්ස් : 011 2 55 66 11 ඊ මේල් : fpa@fpasrilanka.org


## ලෝක ඒඩ්ස් දින පාගමන

ලෝක ඒඩ්ස් දින පාගමන සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන විසින් සංවිධානය කරන ලද මෙම පාගමන සඳහා බන්ධනාගාර අධිකාරිය සහ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අනුග්‍රහය ලබා දෙන ලදි.



## ගෝලීය අරමුදල-දකුණු ආසියානු කලාපීය HIV ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ HIV අවධානම අවම කිරීම සඳහා දකුණු ආසියානු කලාපීය HIV ව්‍යාපෘතිය යටතේ සංවිධානය කළ ජාතික වැඩමුළුව වෝටර්ස් එජ්හි පැවති අවස්ථාව.





ඡායාරූපයේ වමේ සිට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අජිත් රෝහණ මහතා, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය, විශේෂඥ වෛද්‍ය අජිත් කරවිට මහතා, මානව හිමිකම් කොමිසමේ නීතීඥ සමන්ති ජයමහ මහත්මිය

## ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ මාධ්‍යවේදීන් දැනුවත් කිරීම





ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගෞරව වෛද්‍ය අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය අතුල කළුආරච්චි මහතා වැඩමුළුව අමතමින්....

විශේෂඥ වෛද්‍ය අතුල කළුආරච්චි මහතා, ප්‍රජා වෛද්‍ය හරිස්චන්ද්‍ර යකන්දාවල මහතා, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ වෛද්‍ය සංජීව ගොඩකන්දගේ මහතා නියෝජන විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා, වෛද්‍ය අධ්‍යක්ෂිකා සුමිත්‍රා තිසේරා මහත්මිය සහ වෛද්‍ය අචිනි ජයතිලක මහත්මිය වැඩමුළුව සම්පත් දායකත්වයෙන් එක්වූහ.


VISION2020 Sexual and reproductive health rights for all

**සංස්කරණය : ආනන්ද බෝධිනායක - ananda@fpasrilaka.org**
**සම්බන්ධීකරණය : අධිවාචන (Advocacy) ඒකකය**



# FPA පුවත් සංග්‍රහය

2015 තුන්වන කලාපය

www.fpasrilanka.org

තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...

fpa SRI LANKA enriching relationships

VISION2020


# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ලිංගික අනන්‍යතාව, මානව අයිතීන් පිළිබඳ සියලු මාධ්‍ය තුළ වැඩි අවධානයක්, වැඩි අවබෝධයක් ඇති කරමු

### ජාතික සමුළුවේදී ප්‍රවීනයෝ අදහස් දක්වති

අප රට තුළ මාධ්‍ය භාවිතයේදී විවිධ ලිංගික අනන්‍යතාවන් පිළිබඳවත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ ඒ පිළිබඳ මානව අයිතීන් සම්බන්ධවත් මහජනතාව මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයින් තුළ ආකල්පයමය වෙනස්කම් සිදුකිරීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු බව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් පසුගියදා පැවැත්වූ ජාතික මාධ්‍ය වැඩමුළුවේදී ප්‍රවීණයෝ පිරිසක් පෙන්වා දුන්හ.

පුවත්පත්, සිනමාව, නාට්‍යය, රූපවාහිනිය, ගුවන්විදුලිය, ගීත සාහිත්‍යය ආදී ක්ෂේත්‍ර රැසක් නියෝජනය කරමින් සංවාද මණ්ඩපයට පිරිස එක්ව සිටියහ.

3 පිටුවට

## එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම ශ්‍රී ලංකා සංචාරය



එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම පිළිගැනීමේ උත්සවයට සහභාගී වෙමින්...



සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය පාලිත මහීපාල මහතා පිරිස පිළිගනිමින්...

එක්සත් රාජධානි පාර්ලිමේන්තුවේ "ජනගහනය, සංවර්ධනය හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳව සර්ව පාක්ෂික මන්ත්‍රී කණ්ඩායමේ හත්දෙනෙකුගෙන් සමන්විත පිරිසක් පසුගිය නොවැම්බර් 11 දින සිට 17 දින දක්වා ශ්‍රී ලංකාවේ අධ්‍යයන චාරිකාවක නිරත වුහ.

සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය, පාලිත මහීපාල මහතාගේ ප්‍රධානත්වයෙක් පිළිගැනීමේ උත්සවයක් කොළඹ සිනමන් ලේක්සයිඩ් හෝටලයේ දී පැවැත් වුනු අතර, කාසල් රෝහල, පේරාදෙණිය මහ රෝහල, නුවර එළිය FPA සුව සේවා මධ්‍යස්ථානය, බදුල්ල මහරෝහල, මඩකලපුව මහ රෝහල, PSL ත්‍රිකුණාමලය මධ්‍යස්ථානය, තලවතුගොඩ හේමාස් රෝහල, නයින්වේල්ස් රෝහල, ශ්‍රී ජයවර්ධනපුර රෝහල ඔවුන්ගේ නිරීක්ෂණයට ලක් විය. ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් මෙම සංචාරයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි.

2 පිටුවට

## එක්සත් රාජධානියේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම ශ්‍රී ලංකා සංචාරය...



පැමිණ සිටි මන්ත්‍රී කණ්ඩායම ඇතුළු පිරිස



FPA සුව සේවා මධ්‍යස්ථානය - නුවරඑළිය



කොළඹ ද සොයිසා රෝහලේ දී


## ඔබට අපගේ හෘදයාංගම ගෞරවය...



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ප්‍රධාන භාණ්ඩාගාරික ඉස්මත් ඉසදීන් මහතාගේ හදිසි අභාවය අප සංගමයට සිදු වූ බලවත් පාඩුවකි. 1996 සිට විවිධ නිලයන් හොබවමින් ස්වේච්ඡාවෙන් සිදු කරන ලද සේවාව මෙහි දී සිහිපත් කරමු. ඉතාමත් පරිත්‍යාගශීලී අවංක ගතිගුණ එතුමන් තුළින් ප්‍රකට විය. ඉස්මත් ඉසදීන් මහතාණෙනි අපගේ ගෞරව ප්‍රණාමය.

## ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතීන් පිළිබඳ ශබ්දමාලාව දොරට වැඩුම






ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ තරුණ තාක්ෂණික උපදේශක කමිටුව සහ Y - Peer ශ්‍රී ලංකා එක්ව සකස් කළ **ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතීන් පිළිබඳ ශබ්දමාලාව** දොරට වැඩුම පසුගිය දා කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී සිදුවිය. එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මෙම ව්‍යපෘතිය සඳහා අනුග්‍රහය ලබාදී තිබුණි.

## IPPF කලාපීය අධ්‍යක්ෂිකාව සේවා ස්ථාන නිරීක්ෂණයක



සැලසුම් කළ මාපියභාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ දකුනු ආසියා කලාපීය අධ්‍යක්ෂිකා අංජලී සෙන් මහත්මිය RPA සේවා ස්ථාන නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අවස්ථාව.

අංජලී සෙන් මහත්මිය සමඟ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපතිනි වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය, මඩකලපුව සේවා ස්ථානය නිරීක්ෂණ කළ අවස්ථාවේදී එහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර යෝගේෂවරන් මහතා පැහැදිලි කිරීමක් සිදුකරන අවස්ථාව.





## ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ලිංගික අනන්‍යතාව, මනාව අයිතීන් පිළිබඳ ජාතික සමුළුව...





කොළඹ විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අංශයේ ප්‍රධානී චන්ද්‍රගුප්ත තේනුවර මහතා සභාව අමතමින්. ප්‍රවීන මාධ්‍යවේදී බුද්ධදාස ගලප්පත්ති මහතා අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය, ප්‍රවීන නිළි නීටා ප්‍රනාන්දු මහත්මිය ඡායාරූපයේ වෙති.




ජ්‍යෙෂ්ඨ කතුවරියක වන දිල්රුක්ෂි හඳුනෙත්ති මහත්මිය, ධනූ ඉන්නසිතම්බි මහතා, ප්‍රවීන සිනමා අධ්‍යක්ෂ චන්ද්‍රන් රත්නම් මහතා, නව දිල්ලි පර්යේෂණ මධ්‍යස්ථානයේ අකිලා සිවදාස් මිය ඡායාරූපයේ වෙති.

### "මාධ්‍යකරුවන් ලෙස පෙරමුණ ගනිමු..."
- චිත්‍රපට අධ්‍යක්ෂිකා, ඉනෝකා සත්‍යාංගනී

රටක් හැටියට, සංස්කෘතියක් හැටියට බලන විට අපේ රටේ අධ්‍යාපන ධාරාවට ලිංගික අධ්‍යාපනය ස්ථාපනය කර නොතිබීම බොහෝ සමාජ පරිහානිවලට මුල විය හැකිය.

වසර 13 කට පෙර මගේ මුල්ම සිනමා කෘතිය වූ "සුළං කිරිල්ලි" තේමාව වුයේ නිදහස් වෙළඳ කලාපයේ ජීවත් වූ තරුණියක් අනපේක්ෂිත ගැබ් ගැනීමකට මුහුණ දීමය. ඇගේ දරුවා ගබ්සා කර ගන්නවාද නැතිනම් හදාගන්නවද යන ගැටලුව අතර දෝලනය වූ සමාජ බේදවාචකයක දැකිය හැකිවිය. මෙම චිත්‍රපටය වැඩිහිටියන්ට පමණක් සීමා වූ චිත්‍රපටක් හැටියට තීරණය වුනා. මේ චිත්‍රපටය ලෝකය පුරා යද්දි හැමෝම බැලුවේ මෙහි වැඩිහිටියන්ට පමණක් ලෙස නම් කිරීමට හේතු වූ දර්ශන මොනවාද කියා.

අනවසර ගැබ් ගැනීම වැඩිහිටියන්ගේ මාතෘකාවක්ද? යෞවනයන්ගේ මාතෘකාවක්ද ? මේ මාතෘකාව අප කථා කළ යුත්තේ කුඩා දියණියන් පුතුණුවන් ඉදිරියේ නොව ගැටවරවියේ සිටින අය සමඟ ද ? මේ මාතෘකාව ගැන ඇත්තටම කථා කළ යුතු පිරිස පැත්තක තියලා උත්කර්ෂවත් ලෙස වෙනත් තැන්වල සාකච්ඡා කරනවා. මේ වැරදි නිවැරදි කළ යුතුයි. මාධ්‍යකරුවන් ලෙස වගකිව යුතු පිරිසක් ලෙස අප මේ මාතෘකා සමාජගත කිරීමට පෙරමුණ ගත යුතුයි.

ඉන්දියාව, බංගලාදේශය, මාලදිවයින වගේ රටවල මෙවැනි තත්වයක් තිබුණා. එසේම අපට වඩා ඉතාම වාර්ගික අතින් විවිධ, ආගමික සම්ප්‍රදායන් එල්බගෙන ඉන්න රටවල පවා මේ ගැටලුව අතික්‍රමණය කර ඔවුන්ගේ අධ්‍යාපන ධාරවට ලිංගික අධ්‍යාපනය එක්කරගෙන තිබෙනවා. ඒඩ්ස් සම්බන්ධව කථා කළත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගැන කථා කළත්, මත්ද්‍රව්‍ය ගැන කථා කළත් තරුණයින් අදාල කරගෙන කථිකාවට ලක්කළ යුතු දෙයක්.

### "අපි බොහෝ දේ විකුණන්නට පටන්ගෙන..."
- ටෙලි නාට්‍ය, ගයා රම්‍ය අල්විස්

අපේ රටේ පුරෝගාමී ටෙලිනාට්‍ය අධ්‍යක්ෂවරයා වන ධම්ම ජාගොඩයන්ගේ "පළිඟු මැණිකේ"ටෙලි නාට්‍යයේ පවා අපට දක්නට ලැබුණේ වර්තමාන අර්බුදයයි. වෙළඳාම, නාගරීකරණය සමඟ අපට සිදු වූ දේ බොහෝ දේ විකුණන්නට පටන්ගැනීමයි. ජනප්‍රිය ජන සමාජයේ සිට අද බොහෝ දේ විකුණන්න පටන්ගෙන ඇත.

ජන අනුපාතය අනුව වැඩිම නාලිකා ප්‍රමාණයක් ඇති රට ලංකාව. එහෙත් කලාව පවත්වාගැනීමට කළ යුතු ආයෝජන බෙදී ගිය විට කිසිදු නාලිකාවකට ප්‍රශස්ත මට්ටමක ප්‍රතිලාභයක් නෑ. කාන්තාව, HIV, මානව අයිතිවාසිකම් පිළිබඳව වෙන් වෙන්ව කලාව තුළ විග්‍රහ කරන්න බැහැ. මෙය සමාජය තුළ සිදුවන සමස්ත පරිවර්තනය නිසා අර්බුදයක් බවට පත්ව තිබේ.

බොහෝ දෙනෙක් කථාකරන්නේ භාෂාව පිරිහී ඇති බව, චින්තනය පිරිහීම ගැන; අපි සමාජයක් ලෙස අපගමනය වීමකට ලක්ව තිබෙනවා. ටෙලිනාට්‍ය කලාව රූපවාහිනී මාධ්‍ය භාවිතය තුළ ධනාත්මක පරිවර්තනයක් කිරීමට විශාල රාජ්‍ය මැදිහත් වීමක් කළ යුතුයි. ජපානයේ NHK නාලිකාව රාජ්‍ය නාලිකාවක්. රජය එය නඩත්තු කරනවා. ජාතික රූපවාහිනිය යහපත් කලාවක් කරන අතරතුර මුදල් උපයා ගැනීමක් කළ යුතුයි. ආයෝජන සීමා සහිත වන විට අර්බුද මතුවෙනවා. රූපවාහිනී විෂය තුළ ශාස්ත්‍රීය කලාවක් පවත්වාගෙන යාමේ අර්බුදයක් පවතිනවා.





## අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන්




ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා, ගරු ලේකම් නිමල් වීරසේකර මහතා, අලෙවි අධ්‍යක්ෂ සුහයිල් ජුනයිඩ් මහතා පොලොන්නරුවේ පැවැති අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන අමතමින්

## රංගවේදය තුළින් උපදේශනය



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ආලෝකය උපදේශන මධ්‍යස්ථානය පවත්වන රංගවේදය තුළින් උපදේශනය පාඨමාලාවේ ක්‍රියාකාරී අභ්‍යාස අවස්ථාවක්... මේ පිළිබඳ වැඩිවිස්තර ලබා ගැනීමට හදා උඩවත්ත මහත්මිය 0728512823 අමතන්න.

## ස්ත්‍රි-පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය පිළිබඳ වෛද්‍යවරු දැනුවත් කිරීම.






ස්ත්‍රී -පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය පිළිබඳ කොළඹ දිස්ත්‍රික් වෛද්‍යවරු පිරිසක් දනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේදී වෛද්‍ය ඒකකය මඟින් සංවිධානය කර පැවැත්විය. මෙම අවස්ථාවට විශේෂඥ වෛද්‍ය ලක්ෂ්මන් සේනානායක, ප්‍රජා වෛද්‍ය විශේෂඥ නේත්‍රාංජලී මාපිටිගම, WIN ආයතනයේ සුමිත්‍රා ප්‍රනාන්දු වෛද්‍ය ශ්‍රීන් විලත්ගමුව, වෛද්‍ය මනෝජ් ප්‍රනාන්දු /ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ වෛද්‍ය අධ්‍යක්ෂිකා වෛද්‍ය සුමිත්‍රා තිසේරා, වෛද්‍ය අචිනි ජයතිලක, උපදේශිකා හදා උඩවත්ත යන මහත්ම මහත්මීන් විසින් සම්පත් දායකත්වය සපයන ලදි.

## ලෝක මානුෂවාදී දිනය වෙනුවෙන්.....

ලෝක මානුෂවාදී දිනය වෙනුවෙන් ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී වැඩසටහනක් පවත්වන ලදි. මෙම වැඩසටහන ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අධිවාචන ඒකකය මඟින් සංවිධානය කෙරින.





ඇල්ල ප්‍රාදේශීය ලේකම්තුමිය සභාය අමතමින්... ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර රංගික වික්‍රමගේ මහතා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ එෆ්. ඒ. එම්. එල්. උදය කුමාර මහතා සහ පවුල් සංවිධාන සංගමයේ කළමනාකාර මහේෂ් කුමාර මහතා (දකුණුපස ඡායාරූපය)